# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2021 අප්‍රේල්

03 වෙළුම 04 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය




### මාසික ආනයන ක්‍රියාකාරිත්වය




2021 වසරේ අප්‍රේල් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 818ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 189.8කින් ඉහළ ගියේය.

2021 වසරේ අප්‍රේල් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,707ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 52.1කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)




2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී, අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 29.6කින් සහ සියයට 20.0කින් ඉහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය 2020 වසරේ අප්‍රේල් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 840ට සාපේක්ෂව 2021 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 889ක් දක්වා වැඩි විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.- අප්‍රේල් )

අපනයන (එ.ජ. ඩොලර් මිලියන) | ආනයන (එ.ජ. ඩොලර් මිලියන)



# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-අප්‍රේල්)




### අපනයන පරිමා දර්ශකය - (ජන.-අප්‍රේල්)




සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී අපනයන ආදායම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය.

සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

### කෘෂිකාර්මික අපනයන ආදායම




### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




### තේ සහ රබර් මිල ගණන් *




*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.

ප්‍රධාන වශයෙන් තේ, කුළුබඩු (විශේෂයෙන් ගම්මිරිස්, කරාබුනැටි හා කුරුඳු), පොල් සහ මුහුදු ආහාර අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන

### කාර්මික අපනයන ආදායම




### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී කාර්මික අපනයන ආදායම ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-අප්‍රේල්)




### ආනයන පරිමා දර්ශකය (ජන.-අප්‍රේල්)




2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර, මේ සඳහා සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම් ඉහළ යෑම හේතු විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ආයෝජන භාණ්ඩ හා අන්තර් භාණ්ඩ ආනයන පරිමාවන්ගේ ඉහළ යෑම හේතුවෙන් ආනයන පරිමා දර්ශකය ඉහළ ගිය අතර පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමාව පහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්




මුහුදු ආහාර සහ කිරි නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හමුවේ වුවද, ප්‍රධාන වශයෙන් සීනි හා රසකැවිලි සහ තෙල් හා මේද ඇතුළු ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ යාම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේවුව ද, රබර් නිෂ්පාදිත සහ විදුලි සංදේශ මෙවලම් ආනයන වියදම ඉහළ යෑම හමුවේ වුවද, පෞද්ගලික රථවාහන ආනයනය පහළ යෑමත් සමඟ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

## අන්තර් භාණ්ඩ ආනයන

අන්තර් භාණ්ඩ ආනයන වියදම




අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




*2021 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.

ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඛනිජමය නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය

ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | අප්‍රේල් - 20 | අප්‍රේල් - 21 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2020 | ජන.-අප්‍රේල් 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **120.3** | **165.6** | **37.7** | **626.8** | **829.4** | **32.3** |
| එයින් | තේ | 78.4 | 79.3 | 1.1 | 348.4 | 417.4 | 19.8 |
| | පොල් | 14.3 | 27.3 | 91.3 | 84.7 | 123.6 | 45.9 |
| | කුළුබඩු | 12.0 | 22.4 | 85.8 | 63.1 | 136.2 | 115.8 |
| | මුහුදු ආහාර | 6.3 | 19.2 | 206.0 | 63.3 | 75.6 | 19.4 |
| **කාර්මික අපනයන** | | **160.8** | **647.0** | **302.5** | **2,294.8** | **2,949.4** | **28.5** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 65.2 | 366.0 | 461.2 | 1,320.1 | 1,699.5 | 28.7 |
| | රබර් නිෂ්පාදිත | 24.2 | 61.6 | 154.4 | 220.3 | 317.9 | 44.3 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 14.5 | 36.3 | 149.9 | 192.2 | 122.1 | -36.5 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 16.6 | 35.0 | 111.1 | 126.9 | 167.4 | 32.0 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 9.0 | 31.0 | 244.5 | 95.4 | 156.0 | 63.5 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 0.1 | 24.2 | 18,053.4 | 54.7 | 95.0 | 73.6 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 1.0 | 3.8 | 262.1 | 17.6 | 14.9 | -15.3 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **1.2** | **5.5** | **349.5** | **10.3** | **21.5** | **109.4** |
| **මුළු අපනයන** | | **282.3** | **818.2** | **189.8** | **2,931.9** | **3,800.3** | **29.6** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | අප්‍රේල් - 20 | අප්‍රේල් - 21 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2020 | ජන.-අප්‍රේල් 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **302.5** | **278.6** | **-7.9** | **1,268.6** | **1,276.5** | **0.6** |
| **ආහාර හා පාන වර්ග** | | 136.8 | 123.5 | -9.7 | 563.2 | 628.8 | 11.6 |
| එයින් | එළවළු (අ) | 40.9 | 26.9 | -34.1 | 145.6 | 138.0 | -5.2 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 165.7 | 155.1 | -6.4 | 705.4 | 647.7 | -8.2 |
| එයින් | පෞද්ගලික රථවාහන | 60.4 | 1.1 | -98.2 | 216.8 | 3.5 | -98.4 |
| **අන්තර් භාණ්ඩ** | | **570.0** | **1,075.0** | **88.6** | **3,115.7** | **4,065.7** | **30.5** |
| එයින් | ඉන්ධන | 121.8 | 413.2 | 239.2 | 1,070.1 | 1,390.3 | 29.9 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 146.9 | 228.4 | 55.5 | 768.9 | 938.6 | 22.1 |
| | පොහොර | 29.2 | 47.3 | 62.0 | 55.0 | 82.2 | 49.4 |
| | තිරිඟු හා ඉරිඟු | 9.0 | 26.7 | 197.1 | 88.8 | 120.2 | 35.3 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **250.1** | **353.4** | **41.3** | **1,241.0** | **1,405.9** | **13.3** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 113.1 | 227.9 | 101.5 | 685.5 | 913.0 | 33.2 |
| **මුළු ආනයන** | | **1,122.6** | **1,707.0** | **52.1** | **5,625.3** | **6,748.1** | **20.0** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | අප්‍රේල් - 20 | අප්‍රේල් - 21 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2020 | ජන.-අප්‍රේල් 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -840.3 | -888.8 | | -2,693.4 | -2,947.8 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ආ)

| කාණ්ඩය | | අප්‍රේල් - 20 | අප්‍රේල් - 21 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2020 | ජන.-අප්‍රේල් 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 39.3 | 113.9 | 189.8 | 102.0 | 132.2 | 29.6 |
| | පරිමා දර්ශකය | 54.4 | 153.5 | 182.0 | 111.1 | 146.8 | 32.2 |
| | මිල දර්ශකය | 72.2 | 74.2 | 2.8 | 91.8 | 90.0 | -1.9 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 100.5 | 152.8 | 52.1 | 125.9 | 151.0 | 20.0 |
| | පරිමා දර්ශකය | 126.8 | 177.2 | 39.8 | 149.2 | 172.6 | 15.7 |
| | මිල දර්ශකය | 79.3 | 86.2 | 8.8 | 84.4 | 87.5 | 3.7 |
| **වෙළඳ මිල අනුපාතය** | | 91.1 | 86.0 | -5.5 | 108.8 | 102.9 | -5.4 |

(අ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද